# කෙටි පණිවිඩ සහ ක්ෂණික ආයතනික ගනුදෙනු ඇඟවීම් සඳහා නියමයන් හා කොන්දේසි

01. මම/අපි DFCC බැංකුව වෙත (මින් පසු “බැංකුව” ලෙස සඳහන් කරනු ඇත) ආයතනික බැංකු ගිණුම් ගනුදෙනු ඇඟවීම කෙටි පණිවිඩ සේවාව (මින් පසු “සේවාව” ලෙස සඳහන් කරනු ඇත)ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් අනුමත කරන්නේ නඩත්තු කරමින් ඇති හො මෙතැන් සිට කිරීමට නියමිත ආයතනයේ බැංකු ගිණුමේ ගනුදෙනු අදාල ජංගම දුරකථනයට දන්වන ලෙසත්, ඒ සඳහා අදාල ජංගම දුරකථන අංකය වෙනුවෙන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් බලය ලබා දී ඇත. එය ආයතන සඳහා එක් කළ වටිනාකම් පිළිබඳ වන ඉල්ලුම් පත්‍රයේ සඳහන් කිරීමෙන් හෝ බැංකුව වෙත ඇඟවීම් එවිය යුතු ජංගම දුරකථන අංකය සඳහන් කර ලිඛිතව දැනුම්දීමක් මගින් සිදුකරමි/කරමු

02. මෙම සේවාව භාවිතා කිරීමේදී බැංකුවේ උපදෙස් හා / හෝ ක්‍රියා පටිපාටිවලට මම / අපි බැඳී සිටිමු. මෙම උපදෙස් සහ / හෝ ක්‍රියා පටිපාටි අනුගමනය නොකිරීම තුළින් මා / අප වෙත පැන නගින අලාභයක්, හානියක් සහ වියදමක් සඳහා බැංකුවට එරෙහිව පියවර ගැනීමට මට / අපට කිසිදු අයිතියක් නැත.

03. ආයතනය විසින් පත් කරන ලද බලයලත් පුද්ගලයින් හැර වෙනත් අයෙකු විසින් පණිවුඩ හෝ සේවාව භාවිතා කිරීම, පරිගණකය / දුරකථනය බිඳවැටීම හෝ අක්‍රිය වීම, එහි පර්යන්ත සම්බන්ධතාවයන් බිඳවැටීම, දත්ත සැකසුම් පද්ධතිය හෝ සම්ප්‍රේෂණ මාර්ගය වැනි බැංකුවට පාලනය කළ නොහැකි තත්ත්වයන් සඳහා සෘජුව හෝ වක්‍රව, මා / අපට සිදුවිය හැකි හෝ අලාභහානි පිළිබඳ බැංකුව වගකිව යුතු නැති බවට මම/අපි එකඟතාවයකට පත් වෙමි/වෙමු.

04. මා / අප විසින් මෙම නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කළ හොත් සේවාවෙහි කිසියම් වෙනස්කමක් සිදු කිරීමට, සේවාව අත්හිටුවීමට සහ / හෝ අවසන් කිරීමට බැංකුවට අයිතියක් ඇති අතර, පූර්ව දැනුම්දීමකින් තොරව සහ කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම වේලාවකදී සේවාව එහි පූර්ණ හා නිරපේක්ෂ අභිමතය පරිදි වෙනස් කිරීමට අයිතිය ඇත.

05. බැංකුවට දින හතක් (7) ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් (සත්‍යාපනයට යටත්ව) හෝ ඇමතුම් මාධ්‍යස්ථානයේ ක්ෂණික ඇමතුම් හරහා සේවාව භාවිතය නතර කරන ලෙස මම / අපි ඉල්ලා සිටන බව දන්නවා සිටිමි/සිටිමු. මට / අපට සේවාවේ යම් වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා නව අයදුම්පතක් සම්පූර්ණ කර දෙන්නෙමි/දෙන්නෙමු

06. ජංගම දුරකථනය නැතිවූ විට, සොරකම් කළ විට, මාරු කළ විට, අංකය වෙනස් වූ විට හෝ සම්බන්ධතාවය අත්හිටවූ අවස්ථාවකදී වහාම ඇමතුම් මධ්‍යස්ථානය හරහා බැංකුවට දැනුම් දීමට මම / අපි කටයුතු කරමි/කරමු

07. මම / අපි මෙම සේවාව භාවිතා කිරීමේදී එයට සම්බන්ධ හෝ සම්බන්ධ නැති හිමිකම් හෝ ඉල්ලුම් සඳහා වන තත්ත්වයන් වලට බැංකුවට වන්දි ගෙවීමටවත්, වරින් වර සිදුවන අලාභයන් වලට වගකීමටවත් බැංකුව බැඳී නොමැති බවට මෙයින් ඒකාන්තිකව එකඟ වෙමි/වෙමු .

08. මෙහි අඩංගු ඕනෑම නියමයක් හා කොන්දේසියක් ඕනෑම වේලාවක මා / අප වෙත දැනුම් දීමකින් තොරව වෙනස් කිරීමට බැංකුවට අයිතියක් ඇති අතර, එය ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කළ දින සිට නියත වශයෙන්ම මා / අපව බැඳ තබනු ඇත. වෙනස්වීම් මට / අපට ප්‍රාදේශීය පුවත්පත්වල ලිපියක් සහ / හෝ දැන්වීමක් මගින් සහ / හෝ බැංකුවේ වෙබ් අඩවිය, දැන්වීම් පුවරු සහ / හෝ ප්‍රකාශන පණිවිඩ මගින් ප්‍රදර්ශනය කිරීමෙන් සන්නිවේදනය කළ හැකිය.

09. කෙටි පණිවුඩ සහ ක්ෂණික ගනුදෙනු ඇඟවීම් පිළිබඳ මට / අපට ලබා දී ඇති සේවාව සඳහා අවශ්‍ය මුදල් හෝ ගාස්තු, අවශ්‍යතාවය මත බැංකුව ගෙවීමට මම / අපි එකඟ වෙමි/වෙමු. තවද මා / අප විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමක් හර කිරීමෙන් එවැනි ගෙවීම් පියවා ගැනීමට බැංකුවට බලය ඇත. එවැනි මුදල්, ගාස්තු, පවත්නා වෙළඳපල අනුපාතයන්ට හෝ නියාමන බලධාරීන් විසින් පනවනු ලබන ගාස්තු අනුකූල විය යුතුය

10. සමාගමට දැනුම්දීමකින් තොරව සහ කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම වේලාවක මෙම සේවාව අත්හිටුවීමට, අවලංගු කිරීමට, ආපසු ගැනීමට හෝ අවසන් කිරීමට බැංකුවට පූර්ණ අයිතියක් ඇති අතර කිසිදු හානියක් හෝ හානියක් සම්බන්ධයෙන් බැංකුව බැඳී නොසිටිනු ඇත.

11. කෙටි පණිවුඩ සහ ක්ෂණික ගනුදෙනු ඇඟවීම් වාර ගණන වෙනස් කිරීමට සහ ගනුදෙනු ඇඟවීම් ආරම්භ කළ දිනය අභිමතය පරිදි වෙනස් කිරීමට මෙන්ම බැංකුවේ අභිමතය පරිදි හෝ රජය හෝ ඕනෑම නියාමන අධිකාරියක් විසින් පනවා ඇති නීතිය හෝ රෙගුලාසි මගින් එය වරින් වර වෙනස් කළ හැකි වන පරිදි සැකසීමට බැංකුවට අයිතිය ඇත.

12. කෙටි පණිවුඩ සහ ක්ෂණික ගනුදෙනු ඇඟවීම් සඳහා ඕනෑම අලෙවිකරණ පණිවිඩයක් ඇතුළත් කිරීමේ අයිතිය බැංකුවට ඇති බව මම/අපි පිළිගනිමි/පිළිගනිමු. බැංකුවේ එවැනි අලෙවිකරණ පණිවිඩවලට අදාළ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් උල්ලංඝනය නොකිරීමට එකඟ වී සිටිමි/සිටිමු

13. මෙම නියමයන් සහ කොන්දේසි පාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ නීති පද්ධතීන්ට අනුකූලව ය

ගිණුම් යනු ජංගම ගිණුම්, ඉතිරිකිරීමේ ගිණුම්, ණය, කල්බදු, ස්ථාවර තැන්පතු සහ ක්‍රෙඩිට් කාඩ් ය.

මම, අපි, මම, මගේ, අපේ යන වචනවල අර්ථය වනුයේ 2007 අංක 07 දරණ සමාගම් පනත මගින් සංස්ථාගත කරන ලද සමාජ, සංගම්, හිමිකාරත්ව, හවුල්කාරිත්ව සහ පුද්ගලික සමාගම් ය.